# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 16 දරන
# කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 26 වන දින.]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1984 අප්‍රේල් මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි  තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 16 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1984 අප්‍රේල් මස 26 වන දින.]

එල්. ඩී.—ඕ. 64/83.

**1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1984 අංක 16 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**1970 අංක 28 දරන පනත අත්හිටුවීම බල පැවැත්වීම.**

2. 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනත, 1983 නොවැම්බර් මස 18 වන දින සිට හා ඉන් පසුව මේ පනත ආරම්භ වන දිනය තෙක් බලපවත්වා ඇතැයි ද බලපවත්වන්නේ යයි ද සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

**1970 අංක 28 දරන පනතේ 12 වන වගන්තිය සංශෝධනය කිරීම.**

3. අවසන් වරට ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 9 දරන පනතින් සංශෝධනය කරනු ලැබූ 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 12 වන වගන්තියෙහි "අවුරුදු දහතුනක" යන වචන වෙනුවට "අවුරුදු දහඅටක" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**වලංගු කිරීම.**

4. යම් ස්ථානයක කුලී නිවැසියා හෝ එහි පදිංචිව සිටින යම් තැනැත්තකු හෝ එයින් නෙරපනු ලැබ ඇති බව 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 5 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කොමසාරිස්වරයා වෙත නිවේදනය කරනු ලැබූ විට, නිවේදනයේ දිනයෙහි හෝ නෙරපීම සිදු වී ඇතැයි කියනු ලබන දිනයෙහි හෝ ඉහත කී පනත බල නොපැවැත්වූ බව හේතුකොට ගෙන කරන ලදැයි කියනු ලබන නෙරපීම සම්බන්ධයෙන් විභාග කිරීම ප්‍රතික්ෂේප කරමින් කොමසාරිස්වරයා විසින්, 1983 නොවැම්බර් 18 වන දින ආරම්භව මේ පනත ආරම්භ වන දිනයෙහි අවසන් වන්නා වූ කාලය තුළ, නියමයක් කර ඇති අවස්ථාවක, පහත දැක්වෙන විධිවිධාන අදාළ විය යුතු ය:—

(අ) එම නියමය ශූන්‍ය හා බලරහිත වී ඇතැයි ද එසේ වන්නේ යයි ද සලකනු ලැබිය යුතු ය; තවද

(ආ) එම කාරණය අලුතෙන් භාර ගැනීමට, විභාග කිරීමට හා නිශ්චය කිරීමට කොමසාරිස්වරයාට මෙයින් බලය දී බලය පවරා, නියම කරනු ලබන අතර එසේ එම කාරණය අලුතෙන් භාර ගැනීමට, විභාග කිරීමට හා නිශ්චය කිරීමට අධිකරණ බලය ඔහුට ලැබිය යුතු ය.

මේ වගන්තියෙහි "කොමසාරිස්වරයා" යන්නට 1970 අංක 28 දරන කුලී නිවැසියන් ආරක්ෂා කිරීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි දී ඇති අර්ථය ම ඇත්තේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.